# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2195/39 - 2020 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා - 2020.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රා. ලේ. යොමු අංකය : ELDS/LND/04/ACQ/2014/04-11
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/15/2014/VE/435.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙල්ලබඩ ග්‍රාම නිලධාරි වසමේ (188) දම්මෙ නැමැති ගමේ,

**සැළැස්මේ අංකය 61 - ඉඩමේ නම: කුඹල්ගොඩ වත්ත, පරදෙනියහේන්යාය, පරදෙනියහේන; හිමිකම් කියන්නා: ජනතා වතු සංවර්ධන මණ්ඩලය; ප්‍රමාණය: හෙක්. 2.0200**

*මායිම් .- උතුරට* : අ.ග.පි. 70 දෙල්ලබඩ සහ කැ. අ. 3C; *නැගෙනහිරට* : කැබලි අංක 3C සහ 3B; *දකුණට* : කැබලි අංක 3B, 3C සහ 2; *බටහිරට* : කැබලි අංක 2, 3 C සහ අ. ග. පි. 70 දෙල්ලබඩ;

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.30 ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපි ලේඛන එදිනට මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

එස්. ඒ. දිල්රුක්,
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2020 සැප්තැම්බර් මස 18 වැනි දින,
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 645

1A - G 33034 – 30 (2020/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : 13/98/PT/67
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : HIK/DS/LND/04/02/31.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44 බූස්ස ග්‍රාම නිළධාරි වසමේ බූස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 810156 හා 2019.03.28 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 212 සහ 213 මගින් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.101ක් වූ මහගෙදරවත්ත නොහොත් අම්බලන්වත්ත නමැති පහත විස්තර කරන ඉඩම;

**කැබලි අංක 212**
**ඉඩමේ නම : මහගෙදරවත්ත *නොහොත්* අම්බලන්වත්ත**
**ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0510**

*උතුරට* : කැබලි අංක 213, 43 සහ 130; *නැගෙනහිරට* : කැබලි අංක 130 සහ රේස්කෝස් පාර (64); *දකුණට* : කැබලි අංක 215; *බටහිරට* : කැබලි අංක 214 සහ 213.

**කැබලි අංක 213**
**ඉඩමේ නම : මහගෙදරවත්ත *නොහොත්* අම්බලන්වත්ත**
**ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.0500**

*උතුරට* : කැබලි අංක 214 සහ 43; *නැගෙනහිරට* : කැබලි අංක 43 සහ 212; *දකුණට* : කැබලි අංක 212, 215 සහ 214; *බටහිරට* : කැබලි අංක 214.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ඔක්තෝබර් මස 28 වැනි දින ප. ව. 2.00 ට හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 ඔක්තෝබර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඒ. එම්. ඒ. යූ. ජී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
හික්කඩුව.

2020 සැප්තැම්බර් මස 29 වැනි දින,
හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.